අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/37/04(වා.ස්.මා 2024)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023/11/28

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්වීම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ - 2024**

උක්ත ශීර්ෂයෙන් යුතුව මවිසින් නිකුත් කරන ලද අංක 26/2023 හා 2023.06.05 දිනැති අධ්‍යාපන චක්‍රලේඛය ප්‍රකාරව සිදුකරන ලද, මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් 2024.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි.

02. එකී උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් පිළිබඳව අදාල සියලු නිලධරයන් දැනුවත් කළ යුතු අතර 2024.03.01 වන දින අභිනව සේවා ස්ථානයේ වැඩ භාර ගැනීමට හැකිවන පරිදි එකී නිලධරයින් ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධරයින් පැමිනෙන තෙක් රඳවා නොගෙන විධිමත් පරිදි රාජකාරී කටයුතු වලින් මුදා හැරිය යුතුය .

03. මෙම ස්ථාන මාරු නියෝග වලට යටත් නිලධරයෙකුට මෙතෙක් ක්‍රියාත්මක නොවූ, මීට ඉහතදී නිකුත්කර ඇති ස්ථාන මාරු නියෝගයක් වේ නම්, එවැනි නිලධරයන්ට නැවත 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් වෙනත් ස්ථාන මාරු නියෝගයන් ලබා දී ඇත්නම්, එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත සේ සලකා ඔවුන් සම්බන්ධව කටයුතු කළ යුතුය.

04. ඉහත ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අංක 26/2023 දරණ අධ්‍යාපන චක්‍රලේඛයෙහි 08 වන වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, ඒ පිළිබඳව ස්ථාන මාරු ලැබූ නිලධරයන් දැනුවත් වීම කළ යුතුය. මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හරිනු ලබන නිලධරයන් සම්බන්ධයෙන් අංක 26/2023 දරණ අධ්‍යාපන චක්‍රලේඛයේ 08.VIII වගන්තිය අනුව කටයුතු කළ හැකි බව දන්වමි.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

05. ඉහත සඳහන් අංක 26/2023 දරණ අධ්‍යාපන චක්‍රලේඛයෙහි හෝ එකී චක්‍රලේඛයට යාකර ඇති අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි හෝ අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති - 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව සහ ඉහත කී අංක 26/2023 දරණ අධ්‍යාපන චක්‍රලේඛයෙහි 06.II ඡේදයෙහි සඳහන් පරිදි, තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථාන මාරු කමිටුවෙහි අවධානය යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත කරුණු ඉදිරිපත් කළ හැකිය. එකී කරුණු ඉදිරිපත් කිරීම් (ඉල්ලීම් ) මෙයට ඇමුණුම 01 වශයෙන් අමුණා ඇති ආකෘතිය අනුව සකසා 2023.12.08 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

06. ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව මඟින් ලබා දෙනු ලබන තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති - 1 වැනි කාණ්ඩයෙහි 256 වගන්තියෙහි සඳහන් විධිවිධාන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කල හැකිය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, දුක්ගැනවිලි හෝ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත, වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනෙන් පසුවට කල්දමනු නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

07. තවද,ඉහත පළමු ඡේදයෙහි සඳහන් ස්ථාන මාරුවීම් පිළිබඳව විස්තර අමාත්‍යාංශයේ https://moe.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.
02. සියළුම අතිරේක ලේකම්වරු
03. ප්‍රධාන මූල්‍ය නිලධාරි (I/II)
04. අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
05. අතිරේක ලේකම්වරු (ඉංජිනේරු)
06. ජාතික පාසල් අධ්‍යක්ෂ
07. විද්‍යාපීඨ කොමසාරිස්
08. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

(02–08) - කරු අවශ්‍ය කටයුතු සඳහා